•

# දේශීය වෛද්‍ය ක්‍රමයේ වැදගත් අංගයක් වන දැවුම් පිළිස්සුම් වෛද්‍ය කර්මය

පාරම්පරික වෛද්‍ය පද්මසිරි රාජසේකර

ශ්‍රී ලංකාවට ආවේනික ස්වදේශීය වෛද්‍ය කර්මය වසර දහස් ගණනක් පැරණි රාවණා යුගයටත් පෙර සිට පැවත එන්නකි. එම වෛද්‍ය ක්‍රම අතුරින් දැවුම් පිළිස්සුම් වෛද්‍ය කර්මය ඉතාමත් වැදගත් වෛද්‍ය කර්මයකි. අද පවතින නවීන වෛද්‍ය විද්‍යාවෙන් කල නොහැකි බොහෝ දේ දේශීය වෛද්‍ය කර්මයෙන් කළ හැක. මෙහි ඇති වැදගත්කම රෝග නිට්ටාවට සුව කළ හැකි වීමයි. තවද විශේෂත්ත්වය වනුයේ මේ රටට ම ආවේනික වූ ඖෂධ වර්ග වලින් මේ රෝගය සුවපත් කිරීමයි. මෙම දැවුම් පිළිස්සුම් වෛද්‍ය කර්මය පිළිබඳව කථා කරන විට දැවුම් පිළිස්සුම් යන වචන දෙකේ අර්ථකථනය මෙසේය. දැවීමක් යනු රත් වූ දෙයක් ශරීරයේ ස්පර්ශ වීම නැත්නම් ගෑවීම යනුයි.

පිළිස්සීම් ක්‍රම ගණනාවකට සිදු විය හැක. එනම් උණු දිය වලට, උණු පැණි වලට, උණු තාර වලට, උණු කැඳ වලට, ඇසිඩ් වලට, ගින්දර වලට, වෙනත් රසායනික ද්‍රව්‍ය වලට, අකුණු සැරට, විදුලි සැරට, කාබයිඩ්, වෙඩිබෙහෙත්, ගෙන්දගම් ආදී පුපුරණ සුළු ද්‍රව්‍ය වලින් ඇති වූ ගින්දර වලට ඉතා දරුණු අන්දමට පිළිස්සේ. මෙම පිළිස්සීම් වලදී සාමාන්‍ය පිළිස්සීම්ල මාරාන්තික පිළිස්සීම් දෙයාකාරයකට වේ. සාමාන්‍ය පිළිස්සීමක් ලෙස අප හඳුන්වන්නේ ශරීරයේ යම් කොටසක් (අතක්, කකුළක්, ශරීරයේ සුළු ප්‍රමාණයක්) එනම් උණු දිය, උණු කැඳ, උණු තාර, උණු පැණි, උණු තෙල් ආදියකට පිළිස්සීමයි. මාරාන්තික පිළිස්සීමක් යනුවෙන් අදහස් කරන්නේ ශරීරයේ මධ්‍ය කායේ සහ හිස, හෘදය, වස්ති පෙදෙස පිළිස්සීමයි. මෙය ක්‍රම ගණනාවකට සිදු විය හැකිය. ගිනි තබා ගැනීමෙන්, ගිනි ඇවිලීමෙන්, සහසිකයන්ගේ ඇසිඩ් ප්‍රහාර වලින් ආදිය යි. ගිනි ඇවිලීම් වලදී තවත් විශේෂ කරුණක් වන්නේ ගින්න හට ගැනීම සඳහා උපයෝගී වූ ද්‍රව්‍ය යි. එහිදී කාබයිඩ්, වෙඩිබෙහෙත්, ගෙන්දගම් ආදී පුපුරණ සුළු ද්‍රව්‍ය වලින් පිළිස්සීමේදී රෝගියාගේ ශරීරයේ පිළිස්සෙන ප්‍රමාණය අධික වේ. ස්ථර ගණනාවක් ගැඹුරට පිළිස්සේ. සාමාන්‍ය ගින්නක දී වැදගත් වන්නේ පිළිස්සීමට ලක් වන මොහොතේ රෝගියා ඇඳගෙන සිටි වස්ත්‍රය ගින්නට හසුවූ කාළය, පිළිස්සීමට ළක් වූ කාළය ආදිය යි.

කෙසේ නමුත් පිළිස්සීමට ළක්වීමේදී පිළිස්සුණු ද්‍රව්‍ය, ශරීරයේ පිළිස්සුණු ස්ථාන වැදගත් වේ. එම ස්ථාන අනුව තමයි රෝගියාගේ සාධ්‍ය අසාධ්‍යතාවය පැහැදිලිව හඳුනාගත හැකි වන්නේ. ඊට ප්‍රධානව ම බළපාන්නේ ශරීරයේ මර්ම ය. දේශීය චිකිත්සාවේත් ආයුර්වේද වෛද්‍ය කර්මයේත් සඳහන් වන පරිදි ශරීරයේ මර්ම ස්ථාන (මරු පොලවල්) 107 ක් පවතී. එය මෙසේ ශරීරයේ බෙදී යන ආකාරය කෙටියෙන් සඳහන් කරන්නෙමු. දසරුවෙන් උඩ (හිස පෙදෙසෙ) මර්ම ස්ථාන තිස් හත කි (37). හෘදයේ හා ලයේ මර්ම දොළහ කි (12). එක් අතක සහ එක් එක් පාදයක මර්ම එකොළහ බැගින් මර්ම හතලිස් හතර කි (44). පිට කොන්ද පෙදෙසේ මර්ම දහහතර කි (14). මේ ආදී වශයෙන් සියල්ලේ එකතුව මර්ම එකසිය හත කි (107).

මෙයින් එම මර්ම ස්ථාන සද්‍ය ප්‍රාණහර මර්ම, කාලාන්තර ප්‍රාණහර මර්ම, විශල්‍යග්න මර්ම, වෛකල්‍යකර මර්ම, රුජාකර මර්ම වශයෙනි. නැවත මෙම මර්ම, මාංශ මර්ම, ශිරා මර්ම, ස්නායු මර්ම, අස්ථි මර්ම, සන්ධි මර්ම වශයෙන් කොටස් 05 කට බෙදේ. මෙහිදී පිළිස්සුම් වෛද්‍ය කර්මයේ දී අපට වැදගත් වන්නේ සද්‍ය ප්‍රාණහර මර්ම සහ කාලාන්තර ප්‍රාණහර මර්මත් වෛකල්‍යකර මර්මත් වේ. ඊට හේතුව සද්‍ය ප්‍රාණහර මර්මයක් ලෙස අප හඳුන්වන්නේ ඉහතින් සඳහන් වූ මාංශ, ශිරා, ස්නායු, අස්ථි, සන්ධි යන මේ පහ එකට එක්

වූ ස්ථානය කි. මෙය මිනිස් ශරීරයේ බලය රඳා පවතින විශේෂ ස්ථාන වේ. මෙවැනි ස්ථාන අප ශරීරයේ 19ක් ඇතත් බාහිරින් අප ත්‍රිමර්ම ලෙස හඳුන්වන හිස, හෘදය, වස්ති

ප්‍රදේශය ප්‍රධාන වශයෙන් ගැනේ. මෙම මර්ම වලින් එක් මර්මයක් පීඩා වීමෙන් රෝගියා සුව කිරීමට හැකියාවක් අප වෛද්‍ය ක්‍රමය සතුව ඇතත් කීපයක් පීඩාවට පත් වුවහොත් එම පිළිස්සීමට ලක් වූ රෝගියා මරණයට පත් වේ.

කාලාන්තර ප්‍රාණහර මර්මයක් යනුවෙන් අප සඳහන් කරන්නේ මාංශ, ශිරා, ස්නායු, අස්ථි, සන්ධි යන මර්ම වලින් මර්ම 4ක් එකට එක් වූ ස්ථානය කි. මෙම මර්ම පීඩා වීමේදී එකෙනෙහිම හෝ පැය 24ක්, දින 3 ක්, දින 7ක්, ඇතුලත මරණයට පත් නොවේ. රෝගයට අදාල නිසි ප්‍රතිකාරයක් සිදු නොවුනහොත් මාස දෙකක කාළයක දී පිළිස්සීම ට ලක් වූ රෝගියා ඉතා දරුණු ආකාරයට දුක් විඳවා මරණයට පත් වේ. මෙවැනි තත්ත්වයේ රෝගීන් දේශීය දූවුම් පිළිස්සුම් වෛද්‍ය කර්මයෙන් ඉතා සාර්ථක අන්දමට සුවකර ගැනීමට හැකි වේ.

වෛකල්‍යකර මර්ම ශරීරයේ වැඩි සංඛ්‍යාවක් පවතින අතර මෙම ස්ථාන පීඩාවට පත් වීමෙන් රෝගියා අංග විකලතාවය ට පත් වේ. මෙම මර්ම පීඩාවට පත් වූ විට එයට නිසි ඖෂධ යෙදීමෙන් එම රෝගීන් ද කිසිම අංග විකලත්වයකින් තොරව මෙම දේශීය වෛද්‍ය කර්මයෙන් සුව කළ හැකි වේ. දේශීය වෛද්‍ය කර්මයේ ඇති වටිනාකම වැටහේ.

අද පවතින නවීන වෛද්‍ය විද්‍යාවේ දී ඔවුන්ගේ වෛද්‍ය කර්මයෙන් පිළිස්සුනු රෝගියෙකු සුව කළ හැකි ප්‍රතිශතය 50%කි. එවැනි රෝගීන් ද සුව වන්නේ කිසියම් අංග විකලතා, විරූප වීම් ඇතිව නමුත් දේශීය වෛද්‍ය කර්මයේ දී රෝගියෙකුගේ කයින් 3/4 ක් දක්වා පිළිස්සීමට ලක් වූ කෙනෙකු මුළින් ම මෙම වෛද්‍ය කර්මයට යොමු වුවහොත් කිසිම අංග විකලතාවයක ට , විරූප වීමක ට ලක් නොවී සුව කිරීම ට හැකි වේ. මෙම තත්ත්වය ට පිළිස්සුණු රෝගියෙකු මරණය ට පත් වේ. ඊට හේතුව වැරදි ප්‍රතිකර්ම සහ වැරදි උපදෙස් උඩයි.

**අරමුණ**

මෙහි ප්‍රධාන අරමුණ වන්නේ මෙවැනි වෛද්‍ය කර්ම ලොවට හෙළිදරවු කර ඒ මගින් රෝගයෙන් පීඩා විඳින රෝගීන් ට මෙම ඖෂධ වලින් නිසි ඵල ලබා දී ඔවුන් නිට්ටාවට සුව කිරීම යි. තවද මෙම ඖෂධ ශරීරයට හානිකර නොවන අතර. ලාබදායක ද වේ. බටහිර ඖෂධ මෙන් මිළ අධික නොවේ. එම ඖෂධ මිළ අධික පමණක් නොව ශරීරයට හානිදායක ද විය හැකිය. තවද රෝගයක් නිට්ටාවට සුව කිරීමක් නැත. මෙම දේශීය වෛද්‍ය කර්මයේ දී එවැන්නක් සිදු නොවේ. රෝගීන් නිට්ටාවට සුව කළ හැකිය. මෙම දේශයෙන් ම සොයා ගන්නා ඖෂධ නිසා මිළ සාධාරණය. අතුරු ආබාධ නොමැත. එබැවින් මාගේ අරමුණ වන්නේ මෙම වෛද්‍ය කර්මය මේ රටට පමණක් නොව විදෙස් රට වල ට පවා ප්‍රචලිත කිරීම යි. එමගින් රෝගීන් සුව කිරීමයි.

**පිළිස්සුන රෝගියෙකු ජලයෙන් නෑවීම, තෙමීම නොකළ යුත්තේ ඇයි ?**

නවීන වෛද්‍ය විද්‍යාවේ මතය වන්නේ පිළිස්සුන රෝගියෙකු ජලයෙන් නෑවීම, තෙමීම යන්නයි. එය අප රෝගියාට කරන අසාධාරණයකි. එවිට සිදු වන්නේ රෝග තත්ත්වය උත්සන්න වීමකි. ඊට ප්‍රධාන හේතුව පිළිස්සීමකට ලක් වූ රෝගියෙකු ජලයෙන් තෙමූ විට එම ජලය ශරීරයට උරා ගැනීම හේතුවෙන් මොන තරම් ප්‍රබල ඖෂධයක් යෙදුවත් එම ඖෂධයේ ගුණාත්මකභාවය ශරීරයට අවශෝෂණය කර ගැනීම ට නොහැකි වීමයි. තවද පිළිස්සීමට ලක් වූ රෝගියාගේ තාපය ශරීරයේ මාංශ පේශි වල රඳා පවතී. ජලය දැමීමෙන් එය තව තවත් ඇතුලට ගමන් කරයි. එවිට ශරීරයේ ඇති සනායු, කණ්ඩරා, මාංශ තැම්බීමට ලක් වේ. එවිට රෝග තත්ත්වය උත්සන්න වී සුව කිරීමට හැකි ලෙඩුන් පවා මරණයට පත් වේ. තවද තැම්බීමට ලක් වූ එම ස්ථාන වල මස් කුණු වේ. තුවාල පැසවයි.

එවිට වෙන විකල්පයක් නොමැති විට වෙනත් තැනකින් සමක් ගෙන බද්ධ කිරීමක් සිදු කරයි. අපගේ වෛද්‍ය කර්ම වල එවැනි චිකිත්සා නොමැත. රෝගියෙකුට එම පිළිස්සිමට ලක් වූ මොහොතේ සිට සුව වන තෙක් ඇති වන රෝග ලක්‍ෂණ වලට ඉතා සාර්ථක චිකිත්සා කර්ම ඇත. එම ප්‍රතිකාර කරන විට රෝගී තත්ත්වය ක්‍රමාණුකූලව කිසිඳු ආබාධයකින් තොරව සුවපත් වේ. රෝගියාගේ මනස ද යහපත් වේ. මෙහිදී පිළිස්සීම ට ලක් වු රෝගියෙකුට දැවිල්ල, වේදනාව අඩු කිරීම සඳහා පහත සඳහන් ඖෂධ යෙදිය හැකි ය.

**ඇසක් පිළිස්සීම ට ලක් වූ විට,**

නියම වෛද්‍ය කර්මයක ට යොමු වන තුරු මිනිස් ශරීරයේ ලේ බිඳක් ඇසට දැමීම ඉතා සාර්ථක ප්‍රථමාධාරයකි. මෙය විශේෂයෙන් වැදගත් වන්නේ විෂ සහිත කිරි වර්ග, ඇසිඩ් වැනි ද්‍රව්‍ය වලින් පිළිස්සුන විටයි. වෙනත් අවස්ථාවක මව්කිරි ස්වල්පයක් ඇස තුළට දමන්න.

**ශරීරයේ සාමාන්‍ය පිළිස්සීමකදී,**

(උණු දිය, උණු පැණි, උණු තාර, උණු ව්‍යංජන ආදියට) හෙන්ද්‍රික්කා කොළ සෝදා ගලේ දමා අඹරා පොල් තෙල් සමග ආලේප කිරීම.

**මුළු ශරිරයේ වැඩි ප්‍රමාණයක් පිළිස්සුණු විට,**

අළුකෙසෙල් බොඩයේ යුෂ කොටා මිරිකා ආලේප කිරීම.

අභ්‍යන්තර වශයෙන්, ජලය ඉල්ලා කෑ ගසන විට වෙනිවැල් ගැට, කොත්තමල්ලි, වී පොරි, බෙලි මුල් තම්බා පානයට දීමත් ඉතා වැදගත් වේ.